සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

2024-02-08

58256

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |

නම / பெயர் / Name ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

සැලකිය යුතුයි.
- I කොටසේ සියලු ම ප්‍රශ්නවලටත්
- II කොටසේ 1 හා 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

Learning Resource Centre R De Mazenod College Kandana

## I - කොටස

- ඉරි ඇඳි යෙදුම්වලට වඩාත් උචිත අර්ථය තෝරන්න

01. සිංහල ජනකවි ගසට පොත්ත මෙන් ජන සංස්කෘතිය හා බැඳී පවතියි.
    1. දැඩි සම්බන්ධතාවයකින්  2. එකිනෙක යාවී
    3. වෙන් වන ලෙස  4. ස්ථිර ලෙස

02. ජනසන්නිවේදන මාධ්‍ය ආදී නව මුහුණුවරකින් වැඩ සටහන් ඉදිරිපත් කරයි.
    1. වෙනස් ආකාරයකින්  2. නව මුහුණු යොදාගෙන
    3. අලුත් ආකාරයකින්  4. විවිධත්වයකින්

- හිස්තැනට සුදුසු පදය තෝරන්න.

03. ගීත රචකයෝ වෙනත් අයගේ අත්දැකීම් .................................. කරමින් රසාලිප්ත ගීත පබඳිති.
    1. ප්‍රතිරාවය  2. ප්‍රතිනිර්මාණය  3. ප්‍රතියෝජන  4. ප්‍රතිපෝෂණය

04. නානුමුර මංගල්‍යය කතරගම පූජා භූමිය .................................. ව සිදු කෙරෙන තවත් පූජා විධියකි.
    1. නිරාශ්‍රිත  2. මූලික  3. පදනම්  4. ආශ්‍රිත

- පහත සඳහන් වැකි අතුරින් නිවැරදි වාක්‍යය තෝරන්න.

05. 1. බල්ලෝ බුරද්දී සොරු පැන ගියහ.  2. ධීවරයින් විසින් දැල් අදියි.
    3. හාවෙක් දිය සොයා වැවට එයි.  4. ගංගාවන් සයුර බලා ගලා යති.

06. 1. සේවකයෝ සැම දිනකම පාසල් වත්ත පිරිසිදු කරනු ලබයි.
    2. ඇතැමෙක් වැඩ වර්ජනය කරති.
    3. ඔහුත් ඇයත් පරිගණකය ක්‍රියාත්මක කරයි.
    4. විශාල වෘක්ෂයෝ වනාන්තරය අලංකාර කරයි.

- ඉදිරියෙන් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

07. 1. යුගල පද - සිතා මතා, අත මාරු, දුක සැප
    2. බහුව්‍රීහි පද - වත, නා, දිය
    3. උපසර්ග පද - විරාග, නිදොස්, ප්‍රබල
    4. විශේෂණ පද - රතු, උස, වේගයෙන්

08. A - හේතු අනුව යමක් සිතා ගැනීම B - අලුතින් යමක් සෙවීම
ඉහත A හා B සඳහා යෙදිය හැකි තනි පද වන්නේ
1. A - නිරීක්ෂණය B - ගවේෂණය
2. A - අනුමානය B - ගවේෂණය
3. A - විරාගත B - සංරක්ෂණය
4. A - අනුමානය B - නිරීක්ෂණය

09. "කුනිස්සන්ට දැල් දානවා වගේ" යන පිරුළෙන් ප්‍රකාශ වන්නේ,
1. අවසාන උත්සහයක් ගැනීම
2. වැරදි අවබෝධයකින් සිටීම
3. බොරු සෙනෙහසක් පෙන්වීම
4. නිෂ්ඵල ක්‍රියාවක යෙදීම

10. A - මිශ්‍ර ක්‍රියා - පැන පැන B - ආශිර්වාද ක්‍රියා - ලියා
C - පූර්ව ක්‍රියා - ලැබේවා D - විධි ක්‍රියා - එනු මැනවි
ඉහත ප්‍රකාශ අනුව නිවැරදිව ගැළපෙන ක්‍රියා පද වර්ග සොයන්න.
1. A හා D
2. C හා B
3. A හා C
4. B හා D

11. "නුඹ පාසලට යන්නෙහි" මෙහි 'යන්නෙහි' යන ක්‍රියා පදයේ අතීත කාල උත්තම පුරුෂ බහු වචන පදය තෝරන්න.
1. ගියෝය
2. යන්නෙහු
3. ගියෙහු
4. ගියෙමු

12. පහත සඳහන් පද අකාරාදි පිළිවෙලට සැකසූ විට අවසානයට යෙදෙන පදය කුමක්ද?
බොරදිය, කරදිය, වඩදිය, පිනිදිය, මිරිදිය
1. පිනිදිය
2. වඩදිය
3. මිරිදිය
4. බොරදිය

13. "කොස් හා කැවිලි" නාම පද වර්ගීකරණයට අනුව හැඳින්වෙන්නේ,
1. ද්‍රව්‍ය නාම හා ක්‍රියා නාම ලෙසයි.
2. ද්‍රව්‍ය නාම හා ගුණ නාම ලෙසයි.
3. සංඥා නාම හා ද්‍රව්‍ය නාම ලෙසයි.
4. ජාති නාම හා ක්‍රියා නාම ලෙසයි.

14. "අසල් ගෙයක සොරකම් ගිය දවසක - <u>කුහුල්</u> සිතින් ඉන්නේ තම ගෙය රැක"
මෙහි ඉරි ඇඳි පදයට සමානාර්ථවත් පදය නම්,
1. ඉවසීමයි
2. සෝදිසියයි
3. සැකයයි
4. බියයි

15. 'සිසුවකු' 'කතක' යන පදවල උක්ත පද වන්නේ
1. සිසුන් - කතක්
2. සිසුවෙක් - කතක්
3. සිසුවෝ - කතුන්
4. සිසුවන් - කාන්තාවන්

16. "විදුලිය වන් මේ කය ලත් තැනදී
සිදු නොකළොත් මතු සඟ මොක්වර දී"
ඉහත නිර්මාණයේ භාවිත උපමාව හා උපමේය තෝරන්න.
1. උපමාව - විදුලිය, උපමේය - කය
2. උපමාව - කය, උපමේය - විදුලිය
3. උපමාව - සඟ, උපමේය - කය
4. උපමාව - සඟ, උපමේය - මොක්

17. 'මාරුව' - මෙහි යෙදී ඇති පිල්ලම් අනුපිළිවෙළ සොයන්න.
1. ඇලපිල්ල හා කෙටි පාපිල්ල
2. ඇලපිල්ල හා කෙටි ඇදපිල්ල
3. ඇදපිල්ල හා ඇලපිල්ල
4. පාපිල්ල හා ඇලපිල්ල

18. පහත සඳහන් වචනවල හිස්තැනට ගැළපෙන අක්ෂර පිළිවෙළින් යෙදී ඇති පේළිය සොයන්න.
ප්‍රතිලා ................ ය, පරිච් .................. දය, කොට්ඨා .................. ය, නිෂ් ................ ල
1. භා, ජේ, ග, එ
2. භ, වේ, ෂ, ප
3. භා, ජේ, ස, ඵ
4. භ, ඡේ, ශ, ප

19. A - "ඇත්ත තමයි අර බලහල්ලකො බලු කුක්කෙක් වගේ හැංගිලා ඉන්න හැටි"
B - "අලි අනාථාගාරයක දිනකට රැස්වන අපද්‍රව්‍ය ප්‍රමාණය අති විශාලය"
ඉහත උද්ධෘත ඇතුළත්වන පෙළපොත් පාඩම් නම් කරන්න.
1. A - අවුරුදු සිහිනය A - කතරගම පුදබිම
2. A - රාත්‍රිය B - එතනහාමි
3. A - පරාස්ස B- පරිසර හිතකාමී කඩදාසි
4. A - සැබැලෙන්ගතුකම B - අලුත් අවුරුදු උත්සවය

20. "ගිය <u>වැද්දෝ</u> - නොම <u>විද්දෝ</u> - ඉඩ <u>ලද්දෝ</u> අපි මේ වරා"
ඉරි ඇඳි පද සාහිත්‍යයේ හඳුන්වන ශබ්ද රසය කුමක්ද?
1. එළිවැට
2. යතිය
3. රිද්මය
4. අනුප්‍රාසය

(ලකුණු 2×20 = 40යි)

## II - කොටස

**01 හා 02 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.**
**03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. නිර්මාණශීලි කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස 'නාට්‍යමය' ජවනිකාවක් රඟ දැක්වීමට ඔබට සිදුවෙයි.

1. ඔබ රඟ දැක් වූ නාට්‍යයේ නම කුමක්ද? (ලකුණු 01)
2. රඟ දක්වන ලද අවස්ථාවෙන් නිරූපණය වන භූමිකාව (නාට්‍යමය අවස්ථාව) හඳුන්වන්න. (ලකුණු 03)
3. රංගනය තුළින් නිරූපිත චතුර්විධ අභිනයක් නම් කරන්න. (ලකුණු 04)
4. මෙම ඉගෙනුම් අවස්ථාව සඳහා සහයෝගය දැක්වූ තිදෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 03)
5. රංගන ඉගෙනුම් අවස්ථාව තුළ මුහුණ දුන් ගැටලු 3ක් ලියන්න. (ලකුණු 03)
6. නිර්මාණශීලි ඉගෙනුම් අවස්ථාවෙන් ලද ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 16 යි)

02. පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩුවන සේ රචනාවක් ලියන්න.

1. ගෙවතු වගාවෙන් අපි දිනමු.
2. පරිසර පවිත්‍රතාව රැක ගනිමු.
3. මා කැමතිම රූපවාහිනි වැඩසටහන
4. රිය අනතුරු වළක්වා ගන්නේ කෙසේද?
5. අපූරු සිහිනයක් දුටුවෙමි. (ලකුණු 14යි)

03. අ. 8 වන ශ්‍රේණියේ සිසු/සිසුවියන් එකතු වී පාසල් සිසු පොළක් පැවැත්වීමට සූදානම් කර ඇත. ඒ පිළිබඳව පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සුදුසු ආකර්ෂණීය දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ පොළ කමිටුවේ ලේකම් යැයි සිතන්න.
(දිනය, වේලාව, ස්ථානය හා විශේෂ දැනුම්දීම් පිළිබඳ අවධානය යොමු කරන්න.

නැතහොත්

ආ. ඔබ පාසලෙහි අලුතින් විවෘත කළ පුස්තකාලය සඳහා පාසලේ 6 ශ්‍රේණියේ සිට 13 දක්වා සිසුනට කියවීමට විවිධ තේමාවන්ට අයත් පොත් පත් ලබා දෙන ලෙස කොළඹ ජාතික පුස්තකාලයේ, පුස්තකාලයාධිපති වෙත යවන ලිපිය සකස් කරන්න. ඔබ පාසල් පුස්තකාල සංගමයේ ලේකම් යැයි සිතන්න. (ලකුණු 14යි)

04. පහත සඳහන් ප්‍රශ්නවලට පෙළපොත ඇසුරින් පිළිතුරු සපයන්න.

1. "මම දැක්කා අධිරාජ්‍යාගේ ඇස්වලට කඳුළු උනනවා. එය මා ලද උසස්ම ත්‍යාගයයි".
   අ. මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන්ද?
   ආ. ඉහත උපුටා ගැනීම කළ පාඩම කුමක්ද?
2. "ඉඳා ඉක්මනට කඩේට ගිහිල්ලා නූල් රෝද දෙකක් අරගෙන වරෙන්"
   අ. නූල් රෝද ගෙන ඒමට කියන්නේ කවුරුන්ද?
   ආ. එසේ ප්‍රකාශ කරන්නේ කාහටද?
3. "ඇයි ඔය මඩක්කුවේ උඹල තියාපු හොදිවලින් මං ගත්තේ"
   අ. මෙම කොටස උපුටා ගත් පාඩමේ නම ලියන්න.
   ආ. මෙසේ ප්‍රකාශ කළේ කවුරුන්ද?
4. "අනේ බුදු ගම හාමුදුරුවනේ මාව මරන්ඩ එපා. මගේ පණ කෙන්ද රැකගෙන යන්ඩ ඉඩ අරින්ඩ"
   අ. මෙහි මා කවුරුන්ද?
   ආ. මෙම නිර්මාණ රචකයා නම් කරන්න.
5. "අහසේ තරු වැල් පිරිලා - පොළවේ සුදුමල් පිපිලා"
   අ. ඉහත නිර්මාණය උපුටා ගත් පාඩමේ නම ලියන්න.
   ආ. එම නිර්මාණකරුගේ ළමා කාව්‍ය කෘතියත් නම් කරන්න. (ලකුණු 2×5=10යි)

05. පහත සඳහන් කවිවලට සුදුසු ඉතිරි පද දෙක බැගින් නිර්මාණය කරන්න.

1. මගෙ සුරතල් භාවාගේ
කන්පෙති සුදුමල් වාගේ

..........................................

..........................................

2. හිස් වචනයක් කිසි විට දොඩවන්න එපා

..........................................

ඉගෙනුම දෙවෙනි තැනකට දාගන්න එපා

..........................................

3. වන හිස අරා වැජඹෙන ගන තුරු වදුල
සිතු ලෙස ඉරා පතුරයි සඳ රැස් උදුල

..........................................

..........................................

4. ඇසි කෝකිල ගීත නාදය සතුට සම්පත හදවතේ

..........................................

..........................................

වසීවා වැසි යලට මහටත් හැමට සැලසී යහපතේ

5. ..........................................

..........................................

කොපමණ කළද පිං කම් ලොව
බදාගෙන කන එක හරිද බැරිකල මා මරාගෙන (ලකුණු 2×5=10යි)

06. හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

1. වෛද්‍යවරයා පරීක්ෂණ කුටියට .................................. කැඳෙව්වේය. (රෝගියෙකු/ රෝගියෙක්)
2. සමහරෙක් මේ දිනවල ගෙවතු වගාව සාර්ථකව .................................. (කරයි / කරති)
3. විභාග අපේක්ෂකයෝ .................................. නියමිත වේලාවට ශාලාව තුළට ප්‍රවේශ වූහ. (සියල්ලෝම / සියල්ලන්ම)
4. අයියාද අක්කාද එදින එන්නත් විද .................................. (ගත්හ / ගත්තාය)
5. රාජ්‍ය සේවයෙන් විශ්‍රාමික, ඇයට විශ්‍රාම වැටුපක් .................................. (පිරිනමයි/පිරිනැමෙයි)

(ලකුණු 2×5=10යි)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

කප්රුක ලෙසින් විරුදාවලිය ලැබූ පොල් වර්ෂය පුරාම එල දරනා හෙයින් 'සදා එල' ලෙසද හැඳින්වෙන අතර ඉතා උස්ව වැඩෙන නිසා 'දීර්ඝ එල' ලෙසින්ද හැඳින්වේ.

සංස්කෘත භාෂාවෙන් 'නාරිකේල' නමින් හැඳින්වෙන පොල් වලට සිංහලයේ දී 'නෙරළ' යන නමද භාවිතා කෙරේ. මෙහි ප්‍රභේද අනුව වර්ග කිහිපයකි. තැඹිලි, කුන්දිරා, රන් තැඹිලි, ගොන් තැඹිලි, බෝදිලි පොල්, දී කිරිපොල් යනාදි වශයෙනි. ගණ දෙවියන්ට හිමි ඵලයක් ලෙස පොල් හින්දු බැතිමත්තු විශේෂයෙන් සලකති. සිංහලයෝද සෞභාග්‍යයේ සංකේතයක් ලෙස පොල් හඳුන්වති.

ආයුර්වේදයේ ඖෂධ සඳහා ලපටි පොල් මුල්, පොල් වතුර, පොල් මදය, කොට්ටපොල්, පොල් මල්, දවාලු පත්‍ර අළු, පොල් පැණි, පොල් තෙල් ආදිය බහුල ලෙසට යොදා ගැනේ. මෙහිදී පොල් වතුරට සුවිශේෂී තැනක් ලැබේ. ලොව ඇති වටිනාම ශක්තිජනක පානයක් බව නූතන පර්යේෂණයන්ගෙන් සනාථකර ඇත. සෝඩියම්,පොටෑසියම්, මැග්නීසියම්, යකඩ, පොස්පරස්, සල්පර් වැනි ඛනිජ ලවන රාශියක් එහි අඩංගු වෙයි.

2024.02.08 සිංහල 8 ශ්‍රේණිය

58268

පොල්වතුර හෘදයාබාධ, අධිරුධිර පීඩනය, අසාත තත්වයන්ට ද ඉතාම හිතකර ඖෂධීය පානයකි. පොල්තෙල් වලට ද ආයුර්වේදයේ දී විශේෂ තැනක් හිමිවෙයි. අලුත් පොල්තෙල් දේහ බලය වඩවන, ශරීරය පුෂ්ටිමත් කරනා, වාතය හා පිතෙන් හටගන්නා රෝග නැසීමට ද උපකාර වෙයි. කෙස් ගස් වලට හා හිසට ඉතා ම හිතකර නැවුම් පොල්තෙල්, මිහිරි රසයෙන් යුක්තය. ආයුර්වේදයේ හා දේශීය වෙදකමේ බොහෝ වට්ටෝරුවලට පොල් අන්තර්ගත වනුයේ එහි ඇති ඖෂධීය ගුණ නිසාමය.

1. පොල්ගස හඳුන්වන නම් දෙකක් ලියන්න.
2. පොල් වතුර පානයෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
3. පොල්තෙල් භාවිතය හිතකර ද? හේතුවක් ලියන්න.
4. මෙහි සඳහන්වන ප්‍රභේද දෙකක් නම් කරන්න.
5. පහත සඳහන් වචනවල අර්ථ ලියන්න.

අ. පුෂ්ටිමත් ආ. සෞභාග්‍යය (ලකුණු 2×5=10යි)

Learning Resource Center R De Mazenod College Kandana